# අභ්‍යන්තර සටහන

පළාත් මහ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2022-08- 08 |
| වෙත | සියළුම කාර්ය මණ්ඩලය වෙත |
| වෙතින් | අධ්‍යක්ෂ |
| පිටපත් | නිවාඩු අනුමත කිරීමට බලය පවරා ඇති අංශ ප්‍රධානීන්/නිවාඩු විෂය භාර නිලධාරි,තොරතුරු තාක්ෂණ සහකාර |
| විෂයය | ඉතා හදිසි අවස්ථාවකදී සේවයට වාර්තා නොකරන බව ඊ-මේල් මඟින් දැනුම් දීම |
| ගොනු අංකය | BD/PGH/CPMA/1/2013 |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2013 මඟින් නිලධාරීන් සේවයට වාර්තා නොකරන බව දැනුම් දීම සඳහා විද්‍යුත් තැපැල (E-Mail) මඟින්ද දැනුම් දීමට හැකි බවට උපදෙස් නිකුත් කර ඇත.

ඒ අනුව, යම් නිලධාරියෙකුට ඉතා හදිසි අවස්ථාවකදී සේවයට වාර්තා කිරීමට නොහැකිවන විටකදී ඒ බව ටෙලිමේල් පණිවුඩයක් මඟින් දැනුම් දෙන්නේනම්, එය පහත සඳහන් ඊමේල් ලිපිනය පමණක් භාවිතා කර දැනුම් දෙන ලෙසට මෙයින් දැනුම් දෙමි. පහත දක්වා ඇති ඊමේල් ලිපිනය හැර වෙනත් ඊමේල් ලිපිනයන් වෙත දැනුම් දෙන්නේනම්, එය විධිමත් දැනුම් දීමක් ලෙස නොසැළකෙන බවද මෙයින් වැඩිදුරටත් දැනුම් දෙමි. තවද, සේවයට වාර්තා කළ වහාම විධිමත් නිවාඩු අයදුම්පතක් (පොදු 125) මඟින් නිවාඩු අනුමත කරවා ගත යුතුය.

විද්‍යුත් තැපැල් ලිපිනය :- **leave@badullapgh.org**
(E-Mail Address)

අදාළ නිවාඩු විෂය භාර නිලධාරි විසින් විද්‍යුත් තැපැල විවෘත කර, ලිපිය එවනු ලැබූ නිලධාරියා හා අදාළ දිනයන් සහිත තොරතුරු ලේඛනගත කර, රෝහල් අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු අතර, විද්‍යුත් තැපැලෙන් එවනු ලබන සෑම ලිපියක්ම සුරක්ෂිතව විද්‍යුත් තැපැල් ගබඩාව තුළ තැන්පත් කර තිබිය යුතු අතර, කිසිදු ලිපියක් නොමැකිය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 170, 171 හා 172 වගන්තීන් අනුව සේවයට වාර්තා කළ නොහැකි බවට රාජකාරි ආරම්භ කිරීමට නියමිත වේලාවට පැය 24 ක් ඇතුළත විධිමත් පරිදි ආයතන ප්‍රධානියාට දැනුම් නොදුනහොත් තනතුර අතහැර ගියා සේ සළකා කටයුතු කළ හැකි බවද වැඩිදුරටත් මෙයින් දැනුම් දෙමි.

**Director**
**Provincial General Hospital**
**Badulla.**